**කොළඹ දිසා අධිකරණයේ දී ය**

නඩු අංකය - DMR /1467/25
කාර්යය පටිපාටිය - සාමාන්‍ය
ස්වභාවය - වන්දි (අපහාස)
වටිනාකම - රු.100,000,000/-

**රජිත් කීර්ති තෙන්නකෝන්,**
482/4, රාජගිරිය පාර,
රාජගිරිය

<u>**පැමිණිලිකරු**</u>

**එදිරිව**

1. **සමන්ත විද්‍යාරත්න,**
   වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
   11 වන මහළ,
   සෙත්සිරිපාය - දෙවන අදියර,
   බත්තරමුල්ල,

**ස්ථිර ලිපිනය**

8 වන කණුව,රිදීමාලියද්ද,
ඌරදෙණිය,
මහියංගනය

2. ප්‍රියන්ත වෙදමුල්ල,
   සභාපති,
   ස්වාධීන රූපවාහිනී සේවය
   වික්‍රමසිංහපුර,
   බත්තරමුල්ල

3. ස්වාධීන රූපවාහිනී සේවය,
   වික්‍රමසිංහපුර,
   බත්තරමුල්ල

<u>**විත්තිකරු**</u>

වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 18 වන දින දීය.

ඉහත නම් සඳහන් පැමිණිලිකරු ස්වකීය නීතිඥ චතුරංග හතුරුසිංහ මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ල මගින් මෙසේ ප්‍රකාශ කර සිටී.

1. මෙහි මින් මතු විස්තර කරනු ලබන නඩු නිමිති හට ගන්නා ලද්දේ ද ඉහත නම් සඳහන් පැමිණිලිකරුගේ පදිංචිය මෙම අධිකරණ බල ප්‍රදේශය තුළ වන බැවින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 2024 අංක 43 දරණ සංශෝධනයේ අංක 3 දරණ වගන්තිය ප්‍රකාරව මෙම නඩුව පවරා පවත්වාගෙන යාම සඳහා මෙම අධිකරණයට අධිකරණ බලය ඇති බවයි.

2. තුන්වන විත්තිකරු ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය යටතේ නිසිලෙස සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීමකින් යුත් සමාගමක් වන අතර එකී නාමය මගින් සහ එකී නාමයට එරෙහිව නඩු පැවරීමේ සහ පවරනු ලබීමේ හැකියාවකින් යුත් නෛතික පුද්ගලයෙකි.

   අ) ඉහත නම් සඳහන් තුන්වන විත්තිකාර සමාගමේ ලියාපදිංචි කාර්යලය පිහිටා ඇත්තේ ස්වාධීන රූපවාහිනී සංස්ථාව, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල යන ලිපිනයේ වන බවයි.

ආ) ඉහත නම් සඳහන් තුන්වන විත්තිකරු විසින් විකාශණය කරනු ලබන රූපවාහිනී වැඩසටහන් අතරින් සවස 6.30 ප්‍රවෘත්ති විකාශය මෙන්ම උදෑසන පුවත් පත් විචාරය වන පත්තරෙන් එහා වැඩසටහන ප්‍රධාන වන අතර එම වැඩසටහන් හි අන්තර්ගතය සහ හෝ එහි පලවන ප්‍රවෘත්ති පිළිබඳව අභිමතයක් සහ වගකීමක් දෙවන විත්තිකරු දරණ බව කියා සිටී.

3. පැමිණිළිකරු වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 09 වන දින සිට වර්ෂ 2019 ජූලි මස වන දින දක්වා දකුණු පළාතේ හිටපු ආණ්ඩුකාරවරයෙක් ලෙස කටයුතු කරන ලද අතර, වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 05 වන දින සිට වර්ෂ 2019 නොවැම්බර් මස දක්වා මධ්‍යම පළාතේ හිටපු ආණ්ඩුකාරවරයෙක් ලෙස කටයුතු කරන ලද අතර, වර්ෂ 2022 අගොස්තු මස 22 වන දින සිට වර්ෂ 2024 සැප්තැම්බර් මස දක්වා ජනාධිපති ලේකම් කාර්යාලයේ ජනාධිපති අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රජා කටයුතු) ලෙස ක්‍රියා කොට තිබේ.

*පැමිණිළිකරුගේ ජීවදත්ත වාර්තාව පැ-1 ලෙසද, එම ලේඛනය තුළ ඇතුළත් ආණ්ඩුකාර ධූරයට පත් කිරීමේ ලිපි පැ-2(අ) සහ පැ-2(ආ) ලෙසද ජනාධිපති ලේකම් කාර්යාලයේ ජනාධිපති අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රජා කටයුතු) ලෙස පත් කිරීමේ ලිපිය පැ-3 ලෙස ලකුණු කර පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටින අතර එය මෙම පැමිණිල්ලේම කොටසක් ලෙස පිළිගන්නා මෙන් අයැද සිටී.*

4. මෙම නඩුවේ 1වන විත්තිකරු වර්ෂ 2025ක් වූ ජනවාරි 09 වන දින බත්තරමුල්ලේ පිහිටි සෙත්සිරිපාය - දෙවන අදියර තුළ පිහිටන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී මාධ්‍ය සාකච්ඡාවක් සිදු කරන ලද බව කියා සිටී.

5. එම මාධ්‍ය සාකච්ඡාවේ දී 1වන විත්තිකරු විසින් පවසන ලද කරුණු වර්ෂ 2025.01.09 වන දින විත්තිකරු විසින් පවත්වාගෙනු යනු ලබන මුහුණු පොතේ (https://www.facebook.com/profile/100044400261365/search/?q=%E0%B6%87%E0%B6%AD%E0%B7%8A%E0%B6%AD%E0%B6%A7%E0%B6%B8%20) පළකොට තිබූ අතර, ඉන්පසුව විත්තිකරු විසින් එම වීඩියෝ පටය තම මුහුණු පොතෙන් ඉවත් කරගෙන ඇති බව කියා සිටී.

*විත්තිකරු විසින් ස්වකීය මුහුණු පොතේ පළකර ලද වීඩියෝ පටයේ පිටපතක් පැ-4 ලෙස ලකුණු කර පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටින අතර එය මෙම පැමිණිල්ලේම කොටසක් ලෙස පිළිගන්නා මෙන් අයැද සිටී.*

6. එම මාධ්ය සාකච්ඡාවේ දී විත්තිකරු විසින් පවසන ලද කරුණු වර්ෂ 2025.01.09 දින සවස 6.30 ස්වාධීන රූපවාහිනී සේවයේ ප්‍රවෘත්ති විකාශය තුළද ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශණය කරනු ලබන ‘‘පත්තරෙන් එහා‘‘ යන වැඩසටහන මගින් වර්ෂ 2025.01.10 වන දින උදෑසන 6.30 ට විකාශණය වී තිබේ.

<u>1 වන විත්තිකරුට එරෙහිව පළවන නඩු නිමිත්ත සඳහා,</u>

7. ඉහත සඳහන් කරන අන්දමට විත්තිකරු විසින් වර්ෂ 2025ක්වූ ජනවාරි මස 09 වන දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී සිදු කරන ලද මාධ්‍ය සාකච්ඡාවේ කරුණු තම මුහුණු පොතේ මෙන්ම ස්වාධීන රූපවාහිනිය මගින් වාර්තා කොට තිබූ අන්දමට එකී කරුණු වාර්තා කිරීමෙහි අන්තර්ගතයන් වෙන වෙනම ගත් කළ පොදුවේ පැමිණිළිකරුට එරෙහිව පහත සඳහන් කරුණු ඉදිරිපත් කොට වාර්තා කොට ඇති බව කියා සිටී.

I. විත්තිකරු විසින් සිදු කරන ලද මාධ්‍ය සාකච්ඡාව තුළ විනාඩි 6.50 සිට ඉදිරියට "මෙයාගේ ඉල්ලුම් පත්‍රයේ දාලා තියෙන හැඳුනුම්පත් අංකය තමයි උඩින් තියෙන්නේ. මේකේ අංක 13 ක් තියෙනවා. සිරිලිය වගේ තමයි මේකත්. අංක 13 ක් තියෙනවා. එයාගේ ඇත්ත හැඳුනුම්පත් අංකය අපි හොයාගත්තා. මේ යටින් තියෙන්නේ ඇත්ත හැඳුනුම්පත් අංකය. බලනකොට උඩ එකේ තියෙන, 'බිංදුවක් වැඩියි'. බිංදුව අයින් කරලා ගත්තාම කීර්ති තෙන්නකෝන් ගේ හැඳුනුම්පත් අංකය. අන්න එයා තමයි කේ.ටී.රංජිත් කියලා මේ අප්ලිකේෂන් එක ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ කේ.ටී.රංජිත් කියන්නේ කීර්ති තෙන්නකෝන් හිටපු ආණ්ඩුකාරවරයා. ජනාධිපති ලේකම්වරයෙක්. ඉතිං පැහැදිලියි මේ ජාවාරම ඇතුළේ කවුද ඉන්නේ කියලා. එතකොට කේ.ටී.රංජිත් ගේ ඇප්ලිකේෂන් එක මේ තියෙන්නේ ඉඩම ඉල්ලලා. මෙයා මේකෙන් අරං තියෙනවා අක්කර 18 ක් තියෙනවා ඉඩම. මඩෙන් 5 යි. ගොඩින් 13 යි. ඉඩම් අල්ලලා තියෙනවා. දැන් මෙතන වංචාවක් තිබෙනවා.

II. ඇත්ත හැඳුනුම්පත් අංකය බලනකොට උඩ එකේ තියෙන, 'බිංදුවක් වැඩියි'. බිංදුව අයින් කරලා ගත්තාම කීර්ති තෙන්නකෝන් ගේ හැඳුනුම්පත් අංකය. අන්න එයා තමයි කේ.ටී.රංජිත් කියලා මේ අප්ලිකේෂන් එක ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ කේ.ටී.රංජිත් කියන්නේ කීර්ති තෙන්නකෝන් හිටපු ආණ්ඩුකාරවරයා. ජනාධිපති ලේකම්වරයෙක්. ඉතිං පැහැදිලියි මේ ජාවාරම ඇතුළේ කවුද ඉන්නේ කියලා. එතකොට කේ.ටී.රංජිත් ගේ ඇප්ලිකේෂන් එක මේ තියෙන්නේ ඉඩම ඉල්ලලා. මෙයා මේකෙන් අරං තියෙනවා අක්කර 18 ක් තියෙනවා ඉඩම. මඩෙන් 5 යි. ගොඩින් 13 යි. ඉඩම් අල්ලලා තියෙනවා. දැන් මෙතන වංචාවක් තිබෙනවා.

III. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 9 සිට ඉදිරියට ගැසට් කරලා රක්ෂිත වනාන්තරයක් නම් කරලා, ඒ වනාන්තරය මැද අක්කර 18 ක් අල්ලගෙන හිටපු ආණ්ඩුකාරවරයෙක්, ජනාධිපති අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙක්, බොරු නම් දාලා, බොරු හැඳුනුම්පත් අංක දාලා, මෙයා තමයි මේකේ මූලිකයා. මෙයා මොකද කළේ මෙයාගේ ජනාධිපති ලේකම් ධූරය පාවිච්චි කරලා, ඊට පස්සේ ආණ්ඩුකාර ධූරයේ බලයත් පාවිච්චි කරලා. "................... මේකේ හොඳ වෘත්තිකයෝ ඉන්නවා. ව්‍යාපාරිකයෝ ඉන්නවා. ඒ මිනිස්සු නීති විරෝධීව ගිහින් තියෙන්නේ. ඒ මිනිස්සු අමාරුවේ වට්ටපු මිනිහා තමයි මේ ආණ්ඩුකාරවරයා".

IV. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 11.38 සිට ඉදිරියට 'ජනාධිපති ලේකම්, ආණ්ඩුකාර ධූයේ බලය පාවිච්චි කර 'ඉඩම් ලබා ගත්තා'

V. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 5.11 සිට ඉදිරියට "මේ වන විට ජාවාරම්කරුවන් විසින් අක්කර 5,482 ක් අල්ලා ගෙන ඇත''

VI. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 14.47 සිට ඉදිරියට ගස් කපලා තියෙනවා. මේක ඇතුලේ වාඩි තියෙනවා හදලා. ඉතිං එයා කොහොමද වාඩි ගහගෙන ඉන්නේ? බෝගහපැලැස්ස රක්ෂිතයේ අක්කර දහස් ගානක් මෙලෙස අල්ලාගෙන, මඩු ගහලා, වාඩි ගහලා අල්ලා ගෙන තියෙනවා.

VII. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 15.17 සිට ඉදිරියට මහ කැලෑ කපලා තියෙනවා. මහ කැළයක් මැදට විදුලිය ගෙනිහිල්ලා තියෙනවා. බලහත්කාරයෙන් ඉඩම් අල්ලා තියෙනවා. විශාල මුල්‍ය වංචාවක් තියෙනවා.

VIII. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 16.05 සිට ඉදිරියට ජනාධිපති උපදේශක කෙනෙක් කියනවා අහවල් තැන වගා කරගන්න ඉඩම් තියෙනවා.

IX. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 16.47 සිට ඉදිරියට ඉඩම් අක්කරයට රු. ලක්ෂය බැගින් එකතු කර තියෙනවා. "................. ඉඩම් අක්කරයට ලක්ෂය ගානේ අරගෙන තියෙනවා. ඒ සල්ලි කෝ? ඒ සල්ලි දුන්න අයට දැන් ඉඩමත් නෑ. ඔප්පුවත් නෑ. මම ඒ අයට කියන්නේ, දැන් අපිත් එක්ක පැටලෙන්න එපා. කීර්ති තෙන්නකෝන් ලා එක්ක පැටලෙන්න.

X. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 17.41 සිට ඉදිරියට කීර්ති තෙන්නකෝන්ලා එයාලගේ ලේකම්ලා කියනවා 'අපි වගාවටත් උදව් කරන්නම්. ටොම් ඇන්ඩ් ජේ.සී. අඹ දාමු කියලා යෝජනා කරනවා. අපි අඹ පැල සෙයලා දෙන්නම් කියලා, ඒකත් මේ කීර්තිලාගේ කණ්ඩායම බාරගන්නවා. එක අඹ පැලයකට රු. 325 ගානේ අය කරනවා. දහස් ගානක් අඹ පැල ගේනවානේ. අඹ පැල ගෙනල්ලා දැන් ඉඩම් අල්ල ගත්ත කට්ටියට බෙදුවා.

"........... ජනාධිපති ලේකම්වරු, ජ්‍යෙෂ්ඨ උපදේශකවරු, ආණ්ඩුකාරවරු ජාවාරකම්කාර කණ්ඩායම රජයෙන් නිකං දුන්න අඹ පැල මුදලට විකුණලා තියෙනවා.

XI. විත්තිකරු විසින් සිදු කරන ලද සාකච්ඡාවේ විනාඩි 18.50 සිට ඉදිරියට කීර්ති තෙන්නකෝන් කොල්ල කා ඇත.

XII. දැන් වහන්න බැනෙ. දැන් මේවත් අපි දෙනවා. මේ තියෙන්නෙ 1500 ගණන් අඹ පැල බෙදලා. වෙන වෙන මිනිස්සුන්ගෙ නම් දාලා බෙදලා. ඒවා විකුනලා. එතකොට රජයේ ඉඩම් අල්ලලා, රජයේ සල්ලි අරන්, විදුලිය අරගෙන, රජයේ අඹ පැල හිටවලා, ඒකෙනුත් සල්ලි අරගෙන, තමන් හිතවත් ඉඩම් අරන් දෙන අයට.. මොන වගේ ජාවරමක්ද කියලා හිතන්නකො. ඉතින් මේ වගේ තමයි දේශපාලකයෝ. ඉතින් රනිල්ගේ ජ්‍යෙෂ්ඨ ලේකම්වරු, පත් කරපු මෛත්‍රීලගෙ ආණ්ඩුකාරවරු.

XIII. එක අඹ පැලයකට රු. 325 ගානේ අය කරනවා. ඉතින් දාස් ගානක් අඹ පැල තියෙනවා නේ. අඹ පැල ගෙනල්ලා ඒ ගොවි ඉඩම් අල්ල ගත්ත කට්ටියට බෙදුවා. ඉතිං ඒ කට්ටිය ඒ වා හිටෙව්වා තැන් තැන්වල. ඔබ අතර මේ ඉඩම් ගත්ත කෙනෙකුට ආරංචි වෙනවා මේ අඹ පැලවලට අපෙන් සල්ලි ගත්තට මේ රජයෙන් නොමිලේ බෙදපු අඹ පැල තමයි මේ අපිට බෙදලා තියෙන්නේ කියලා. ඒකේ ඇතුලේ කීර්ති, කීර්තිගේ පුද්ගලික ලේකම් ඉන්නවා.

XIV. ඉඩම් අක්කරයට ලක්ෂය ගානේ එකතු කරලා තියෙනවා. ඒ සල්ලි කෝ? ඉතිං සල්ලි දීපු මිනිස්සුන්ට දැන්, ඔප්පුවකුත් නෑ. බලපත්‍රයකුත් නෑ. සල්ලිත් නෑ. දැන් ප්‍රශ්නයක් පැනනැගිලා තියෙනවා. මම කියන්නේ ඔය ඉඩම් ගත්ත වෘත්තියකින්ට ව්‍යාපාරිකයින්ට කියන්නේ. මේ අපිත් එක්ක පැටලෙන්න එපා. ඔය සල්ලි ගත්ත, අනීතික ලෙස ගත්ත කීර්ති තෙන්නකෝන්ලත් එක්ක පැටලෙන්න.

XV. මහ කැලෑ කපලා තියෙනවා. මහ කැලයක් මැදට විදුලිය ගෙනිහිල්ලා තියෙනවා. බලහත්කාරයෙන් ඉඩම් අල්ලලා තියෙනවා. ඉතිං මේ වගේ විශාල මූල්‍ය වංචාවක් තියෙනවා.

ඉහත කරුණු ඇතුළත් විත්තිකරු විසින් අදාළ මාධ්‍ය සාකච්ඡාවේ දී සිදු කරන ලද ප්‍රකාශයන්හි අන්තර්ගතය ඇතුළත් සීඩී පටය *X* ලෙසත්, එම සිඩී පටයේ ඇතුලත් විත්තිකරුගේ ප්‍රකාශය ලිඛිතව සටහන් කොට ඇති ප්‍රකාශය *X*1 ලෙසත් පැමිණිල්ල සමග ඉදිරිපත් කර තිබේ.

8. පැමිණිළිකරු කියා සිටින්නේ, ඉහත 7 වන ඡේදයේ සඳහන් කරණ ලද වචන, ප්‍රකාශණ සහ පාඨ එක්ව ගත් කළ ද, වෙන් වෙන්ව ගත් කළ ද, එකී වචන ප්‍රකාශණ සහ පාඨ එනයින්ම පැමිණිළිකරුට අදාළ වන බවත් එකී වචන, ප්‍රකාශණ සහ පාඨ තුළ පැමිණිළිකරුගේ නම ප්‍රකාශිතව සඳහන් කර ඇති බව කියා සිටී.

9. ඉහත 7 වන ඡේදයේ අන්තර්ගත වචන, ප්‍රකාශණ සහ පාඨ අසත්‍ය වන අතර, එම වචන, ප්‍රකාශණ සහ පාඨ එනයින්ම අපහාසාත්මක වන බවත්, (per se Defamatory) එසේම වක්‍රෝක්තියෙන් ද (By Innuendo) පැමිණිළිකරු කෙරෙහි අපහාසාත්මක වන බවත්, විත්තිකරු විසින් ඉහත සඳහන් මාධ්‍ය සාකච්ඡාවේදී වචන, පාඨ සහ ප්‍රකාශයන් ප්‍රකාශයන්ට පත් කරන ලදදේ ද, එකී කරුණු මුහුණු පොත, වෙබ් අඩවි සහ පුවත් පත් හරහා ප්‍රකාශණයට ලක්කොට බෙදා හරින ලද්දේ ද, පැමිණිළිකරු කෙරෙහි වන ප්‍රකාශිත ද්වේශයෙන් බවත් (Express malice), පීඩන චේතනාවෙන් බවත්, (Animus Injuriandi) එමගින් පැමිණිළිකරු ශ්‍රී ලංකාවේ මහජනතාව සහ පොදු සමාජය ඉදිරියේ දූෂිතයෙකු වංචනිකයෙකු සහ අපචාරියෙකු බව හුවා දක්වමින් ශ්‍රී ලාංකික සමාජය තුළ වෛරයට අප්‍රසාදයට අවමානයට පිළිකුළට සහ අපහාසයට ලක් කිරීමේ අදහසින් බව පැමිණිළිකරු ප්‍රකාශ කර සිටී.

10. 1 වන විත්තිකරු විසින් ඉහත සඳහන් මාධ්‍ය සාකච්ඡාවේ දී පැමිණිළිකරුට එරෙහිව සිදු කළ මෙම පැමිණිල්ලේ 7 වන ඡේදයේ සඳහන් කරුණු තුළ දැක්වෙන පාඨ සහ/හෝ ප්‍රකාශ සහ/හෝ වචන එක්ව ගත් කළ සහ/හෝ වෙන් වෙන්ව ගත් කළ වරදි, අසත්‍ය සහ පැමිණිළිකරු පිළිබඳ විශේෂයෙන්ම අපහාසාත්මක කරුණු බව කියා සිටී. ඒ කෙසේ ද යත්,

I. ඉහත 7 වන ඡේදයේ සඳහන් පළවන කරුණ X ලෙස ලකුණු කරන ලද හඬ පටය තුළ විත්තිකරු ප්‍රකාශය ඇරඹීමෙන් පසු විනාඩි 6.50 පසු ඉදිරියට සඳහන් වන කරුණු අතර '' මෙයාගේ ඉල්ලුම් පත්‍රය'' ලෙස හැඟවෙන්නේ පැමිණිළිකරු විසින් ඉදිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් බවත්, එහි හැඳුනුම්පත් අංකයක් පවතින බවත්, එම හැඳුනුම්පත් අංකය පැමිණිළිකරුට අයත් වූවක් බවත් වක්‍රෝක්තියෙන් සඳහන් කර ඇති බවත්, එම හැඳුනුම්පත් අංකය වංචනික ලෙස ඉලක්කම් 13 කින් සඳහන් කර ඇති බව විත්තිකරු සඳහන් කරයි. ඉන් අනතුරුව විත්තිකරු කියා සිටින්නේ එම ක්‍රියාව සමාජය තුළ කුප්‍රකටව කතා බහට ලක් වූ දූෂිත ගනුදෙනුවක් වූ සිරිලිය ගනු දෙනුවට සමාන වන බවයි.ඒ අනුව විත්තිකරු විසින් පැමිණිළිකරු දූෂිත පුද්ගලයෙකු බව වක්‍රෝක්තියෙන් පවසයි.එම ප්‍රකාශය පැමිණිළිකරු කෙරෙහි අපහාසාත්මක බව කියා සිටී.

(a) එසේම එම ප්‍රකාශය සිදු කිරීමට විත්තිකරු විසින් පදනම් කර ගන්නේ, අන්නාසිගල ගොවි සංවිධානය නමැති සංවිධානයක් විසින් යෝජනා කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත රජයේ ඉඩම් ලබා

ගැනීම සඳහා පුද්ගල ඉල්ලීම් 82 ක් පදනම් කර ගනිමින් කේ.ටී. රංජිත්, එච්.එම්.ජී. සමරතුංග , ටී.ඩී. හංසජ නමින් කරණ ලද ඉල්ලීමකි. එම ඉල්ලීමට අත්සන් කොට ඇත්තේ, කේ.ටී රංජිත් නමැත්තෙක් පමණි. එම ඉල්ලීම මගින් ආයාචනය කොට ඇත්තේ, හල්දුම්මුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මහලන්ද ග්‍රාම නිළධාරී වසමේ අන්නාසිගල පිහිටි උණකන්ද නමැති රජයේ ඉඩමේ රජයේ ඉඩම් වලින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් ලබා දෙන ලෙසටය. මෙම ඉල්ලීමට අත්සන් කොට ඇති කේ.ටී. රංජිත් නමැති අය සහ පැමිණිළිකරු අතර කිසිදු සම්බන්ධයක් නොමැති බව පැමිණිළිකරු කියා සිටී. කෙසේ නමුත් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම්වරයා එම ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු නිළ පියවරක් නොගෙන ඇති බවද කියා සිටී.ඒ අනුව මෙම ප්‍රකාශය මගින් පදනම් විරහිත චෝදනාවක් එල්ලකොට ඇති අතර එකී වචන, පාඨ සහ ප්‍රකාශ පැමිණිළිකරු කෙරෙහි අපහාසාත්මක බව කියා සිටී.

II. (අ) ඉහත I යටතේ සඳහන් කරන ලද කරුණු පදනම් කරගනිමින්ම විත්තිකරු කියා සිටියේ,

(ආ) හැඳුනුම් පත් අංකයේ බින්දුවක් අයින් කරලා ගත්තම එම හැඳුන්ම්පත් අංකය අයත් වන්නේ කීර්ති තෙන්නකෝන් එනම් මෙම පැමිණිළිකරුට බව කියා තිබේ.

(ඇ) ඒ අනුව, අන්නාසිගල ගොවි සංවිධානය යටතේ කේ.ටී. රංජිත් ලෙස ඉල්ලුම්කර ඇත්තේ කීර්ති තෙන්නකෝන් නමැති පැමිණිළිකරු බවයි. එම ඉල්ලීම මත "මෙයා" ලෙස වක්‍රෝක්තියෙන් සඳහන් කරන පැමිණිළිකරු අක්කර 18ක් අයත් කරගෙන ඇති බවත්, එටම ඉඩම් ප්‍රමාණය මඩෙන් පහයි, ගොඩෙන් දහතුනක් ලෙස රජයේ ඉඩම් අල්ලාගෙන තිබෙන බවත් කියා තිබේ. එය වංචාවක් බව විත්තිකරු පවසයි. විත්තිකරු කියා සිටින්නේ, එම ප්‍රකාශය අසත්‍යයක් මෙන්ම අපහාසාත්මක වන බවයි.

(ඈ) විත්තිකරු තවදුරටත් පවසන්නේ, කේ.ටී.රංජිත් ලෙස පෙනී සිටින්නේ, හිටපු ආණ්ඩුකාරවරයා සහ හිටපු ජනාධිපති ලෙකම්වරයෙකු වන කීර්ති තෙන්නකෝන් වන බවයි. ඒ අනුව අදාළ වංචාව පැමිණිළිකරු සිදු කොට ඇති බව විත්තිකරු කියා සිටී. ඒ අනුව ඉහත (අ),(ආ),(ඇ) සහ (ඈ) ඡේදයන් හි සඳහන් ප්‍රකාශ පැමිණිළිකරු කෙරෙහි අපහාසාත්මක ප්‍රකාශ වන බව කියා සිටී.

III. ඉහත 7 වන ඡේදයේ සඳහන් පළවන කරුණ X ලෙස ලකුණු කරන ලද හඬ පටය තුළ විත්තිකරු ප්‍රකාශය ඇරඹීමෙන් පසු විනාඩි 9.00 සිට ඉදිරියට විත්තිකරු කරණ ප්‍රකාශ තුළ පහත සඳහන් අපහාසාත්මක ප්‍රකාශ ඇතුළත් වන බව කියා සිටී. එනම්, ගැසට් මගින් රක්ෂිත වනාන්තරයක් නම් කොට ඒ වනාන්තරය මැද අක්කර 18 ක් බොරු නම් දාලා බොරු හැඳුනුම්පත් අංක දාලා හිටපු ආණ්ඩුකාරවරයෙක් සහ ජනාධිපති අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් ලෙස තම බලය අනීතික ලෙස භාවිතා කරමින් වංචනික ක්‍රියාවලියක මූලිකයා වෙමින් මිනිසුන් අමාරුවේ වැට්ටූ බව විත්තිකරු විසින් ප්‍රකාශ කොට තිබේ. කරුණු වශයෙන් ගත් කළ විත්තිකරුගේ මෙම ප්‍රකාශය අපහාසාත්මක වන අතර එසේ සඳහන් කරන ලද කිසි කරුණක් සත්‍ය නොවන බව කියා සිටී.

IV. ඉහත 7වන ඡේදයේ සඳහන් X ලෙස ලකුණු කරන ලද හඬ පටය තුළ විනාඩි 11.38 ට සඳහන් ජනාධිපති ලේකම් තමා ආණ්ඩුකාර ධූරය භාවිතා කර ඉඩම් ලබා ගත්තාය යන්න

අසත්‍ය කරුණක් වන අතර එම නිසා එකී ප්‍රකාශය පැමිණිලිකරු කෙරෙහි අපහාසාත්මක බව කියා සිටී.

V. ඉහත 7 වන ඡේදයේ සඳහන් X ලෙස ලකුණු කරන ලද හඬ පටය තුළ විනාඩි 5.11, විනාඩි 14.44 , විනාඩි 15.17 ට ප්‍රකාශ කරන ලද පිළිවෙළින් 5,6,7 යන කරුණු අසත්‍ය කරුණු බව ප්‍රකාශ කර සිටී.ඒ අනුව විනාඩි 16.05ට විත්තිකරු කියා ඇති 7 වන ඡේදයේ දැක්වෙන VIII වන කරුණ පැමිණිලිකරු කෙරෙහි අපහාසාත්මක බව කියා සිටී.

VI. ඉහත 7 වන ඡේදයේ දැක්වෙන X ලෙස ලකුණු කරන ලද හඬ පටය තුළ විනාඩි16.47ට, විනාඩි 17.41, දැක්වෙන කරුණු අසත්‍ය කරුණු වන අතර එකී කරුණු මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් අපහාසාත්මක වන බව කියා සිටී.

VII. ඉහත 7 වන ඡේදයේ දැක්වෙන X ලෙස ලකුණු කරන ලද හඬ පටය තුළ විනඩි 18.50ට දැක්වෙන ප්‍රකාශය තුළින් මෙම පැමිණිලිකරු කොල්ලකරුවෙකු ලෙස හඳුන්වා දී ඇති අතර එය පැමිණිලිකරු කෙරෙහි අපහාසාත්මක ප්‍රකාශයක් බව කියා සිටී.

VIII. ඉහත 7 වන ඡේදයේ දැක්වෙන X ලෙස ලකුණු කරන ලද හඬ පටය තුළ දැක්වෙන XII,XIII,XIV,XV යටතේ දැක්වෙන කරුණු හරහා විත්තිකරු විසින් කරණු ලබන ප්‍රකාශ එනම් පැමිණිලිකරු ජාවාරම් කරුවෙකු බවත්, එකී ජාවාරම් කරන්නේ පැමිණිලිකරු රාජ්‍ය බලය භාවිතා කරමින් බවත් එසේම රජයෙන් නොමිලේ ලබා දෙන අඹ පැල මුදලට විකුණා වංචාවක් සිදු කරන ලද වංචනිකයෙකු බවත් එකී වංචාවක් හරහා මුදල් ලක්ෂ ගණනින් අනීතිකව පැමිණිලිකරු විසින් උපයාගෙන ඇති බවත් සඳහන් කිරීම පැමිණිලිකරු කෙරෙහි අපහාසාත්මක ප්‍රකාශයක් බව කියා සිටී.

11. ඉහත 7 වන ඡේදයේ සඳහන් කරුණු 10 වන ඡේදයේ විස්තර කර ඇති පරිදි අපහාසාත්මක ප්‍රකාශ වන අතර ශ්‍රී ලාංකික මහජනතාව විසින් එකී කරුණු 10 වන ඡේදයේ විස්තරකර ඇති අයුරින් අවබෝධකරගෙන ඇති බව පැමිණිලිකරු කියා සිටී.

12. විත්තිකරු විසින් තමන්ගේ මෙහෙයවීමෙන්ම සහ කැමැත්තෙන්ම මෙටා (meta) නමැති බහුජාතික සමාගමට අයත් මහජන සන්නිවේදන වේදිකාවක් වන මුහුණු පොත (Face book) හි සමාජිකත්වය දරණ අතර විත්තිකරු විසින් චේතනාන්විතවම ඉහත 7 වන ඡේදයේ සඳහන් X ලෙස ලකුණු කර ඇති හඬ පටය තුළ ඇතුළත් කරුණු සිය මුහුණු පොත මගින් ප්‍රකාශයට පත් කර තිබෙන බව කියා සිටී.ඒ හැරුණු කොට මෙම පැමිණිල්ලේ 7 වන ඡේදය යටතේ සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය තුළින් පළවන විත්තිකරු විසින් පැමිණිලිකරුට එරෙහිව සිදු කරන ලද අපහාසාත්මක ප්‍රකාශ පුනරුච්ඡාරණය කරමින් සමාජය තුළ සංසරණය කරන ලද බව කියා සිටී.

13. ඉහත විත්තිකරුට අයත් සිය මුහුණු පොතේ පලවූ X ලෙස ලකුණු කර ඇති හඬ පටය තුළ ඇතුළත් කරුණු ශ්‍රී ලංකාවේ මුහුණු පොත පරිහරණය කරුණු ලබන ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් අතරේ බෙදා හරින ලද බවත්, ඊට අමතරව එම මුහුණු පොතේ සඳහන් කරුණු විවිධ සමාජ මාධ්‍ය වේදිකා මගින් නැවත පළකොට ඇති බවත් කියා සිටී.

14. එසේම, ඉහත 7 වන ඡේදයේ සඳහන් වන විත්තිකරුගේ ප්‍රකාශයන් මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරන ලද බවත්, මුද්‍රිත මාධ්‍යයන් මගින් පළකොට මහජනතාව සහ එහි පාඨකයන් අතර ප්‍රකාශණය කොට ප්‍රසිද්ධ කොට ඇති බව කියා සිටී.

15. ඉහත 7 වන ඡේදයේ සඳහන් වන පළවන විත්තිකරුගේ ප්‍රකාශයන් ස්වාධීන රූපවාහිනී සේවය මගින් විශාල ප්‍රසිද්ධියක් 1 වන විත්තිකරුගේ අපහාසාත්මක ප්‍රකාශවිකාශය කොට, මහජනතාව සහ එහි ප්‍රේක්ෂකයන් අතර ප්‍රසිද්ධ කොට ඇති බව කියා සිටී.

16. එම නිසා 10 වන ඡේදයේ මහජනතාව විසින් තේරුම්ගනු ලබන වචන, ප්‍රකාශණ,පාඨ තුළින් වක්‍රෝක්තීන් ලබා දෙන අර්ථයන් සපුරා අසත්‍ය මෙන්ම ද්වේශ සහගත ප්‍රකාශ වන අතර පැමිණිළිකරු සම්බන්ධයෙන් එම ප්‍රකාශ අපහාසාත්මක වන බව කියා සිටී. එසේම, එම ප්‍රකාශයන් ස්වාධීන රූපවාහිනිය විසින් ප්‍රසිද්ධ කොට ඇත්තේ ප්‍රකාශිත ද්වේශයෙන් (Express malice) බවද, පීඩක චේතනාවෙන් (Animus injuriandi) යුතු බවද, පැමිණිළිකරු ශ්‍රී ලාංකික සමාජය ඉදිරියේ වෛරයට,අපවාදයට, පිළිකුලට සහ අපහාසයට ලක් කිරීමේ වැරදි අදහසින් බවත් කියා සිටී.

17. විත්තිකරු 7 වන ඡේදයේ X ලෙස ලකුණු කර ඇති සීඩී පටයේ අඩංගු ප්‍රකාශය සිදු කිරීම හේතුවෙන් පැමිණිළිකරුට පුද්ගලයෙකු වශයෙන් ද සමාජ සහ දේශපාලන ක්‍රියාකාරිකයෙකු වශයෙන්ද, සමාජයේ මත දරන්නෙකු ලෙසද, තමන්ගේ හොඳ නමට, ප්‍රතිරූපයට, ගරුත්වයට, කීර්තිනාමයට,කුසලතාවයට හා චරිතයට හානි සහ පාඩු සිදු කර තිබේ. පැමිණිළිකරු එකී පාඩුව රුපියල් මිලියන 100 ක මුදලකට තක්සේරු කර සිටී.

18. පැමිණිළිකරු විසින් ඉහත කී අලාභයසම්බන්ධයෙන් රුපියල් මිලියන 100 ක් ඉල්ලා ස්වකීය නීතිඥ චතුරංග හතුරුසිංහ මගින් පළමුව එන්තර වාසියක් 2025.01.24 දිනදී ද, එකී එන්තරවාසියේ පැවති දිනයේ දෝෂයක් හේතුවෙන් දෙවන එන්තරවාසිය එම නීතිඥවරයා මගින්ම 2025.01.27 දිනැති එන්තරවාසිය විත්තිකරු වෙත යොමු කොට තිබූ බවත්, විත්තිකරු පැමිණිළිකරු පළවන දෝෂ සහගත එන්තරවාසියට විත්තිකරුගේ නීතිඥවරයා මගින් මගින් පිළිතුරු ලබා දී පැමිණිළිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබූ නමුත් දෙවන එන්තරාවාසියට පිළිතුරු ලබා දීම පැහැර හැර තිබූ බවයි.

එකී පළමු එන්තර වාසිය පැ-5 ලෙසත්, පැමිණිළිකරු විසින් විත්තිකරුට යොමු කරන ලද දෙවන එන්තරවාසිය පැ-5 (1) ලෙසත් ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය පැ-5 *(2)* ලෙසත් එකී පළමු විත්තිකරුගේ නීතිඥ විසින් එවන ලද ලිපිය පැ-5 (3) ලෙසත්, ලකුණු කර මේ සමග ඉදිරිපත් කර සිටින අතර එය පැමිණිළිල්ලේම කොටසක් ලෙස පිළිගන්නා මෙන් අයැද සිටී.

19. ඉහත කී කරුණු හේතුවෙන් එකී රුපියල් මිලියන 100 සහ ඊට අදාළ පොලිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ශීර්ෂයේ සඳහන් විත්තිකරුට එරෙහිව නඩු පැවරීම සඳහා නඩු නිමිත්තක් උපවය වී ඇති බවයි.

<u>දෙවන විත්තිකරුට එරෙහිව නඩු නිමිත්තක් සඳහා,</u>

20. පැමිණිළිකරු ඉහත 1 සිට 22 දක්වා ඡේදයන් නැවත නැවතත් පුනරුච්ඡාරණය කර සිටී.

21. ඉහත නම් සඳහන් දෙවන විත්තිකරු විසින් වර්ෂ 2025.01.09 දින සවස 6.30 ප්‍රවෘත්ති විකාශය තුළින් 1 වන විත්තිකරු විසින් වර්ෂ 2025.01.09 වන දින බත්තරමුල්ලේ පිහිටි වැව්ලි කර්මාන්ත

අමාත්‍යාංශයේ දී සිදු කරන ලද මාධ්‍ය සාකච්ඡාවේදී පළකරන ලද අදහස් ඉහත 7 වන ඡේදය යටතේ විකාශණය කරන ලද බව කියා සිටී.

ඒ බව සනාථ කිරීම සඳහා 2025.01.09 දින ප්‍රවෘත්ති ප්‍රකාශයෙන් විකාශය කෙරුණු වැඩ සටහන් අන්තර්ගත රූපරාමු හා හඬපට ඇතුළත් සංයුක්ත තැටිය පැ-6 ලෙස ලකුණු කර මේ සමග ඉදිරිපත් කර සිටින අතර එය පැමිණිල්ලේම කොටසක් ලෙස බාර ගන්නා මෙන් අයැද සිටී.

22. ඉහත නම් සඳහන් දෙවන විත්තිකරු විසින් වර්ෂ 2025.01.10 පත්තරෙන් එහා වැඩසටහන විකාශනය තුළින් ද, 1 වන විත්තිකරු විසින් වර්ෂ 2025.01.09 වන දින බත්තරමුල්ලේ පිහිටි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී සිදු කරන ලද මාධ්‍ය සාකච්ඡාවේදී පළකරන ලද අදහස් විකාශණය කරන ලද බව කියා සිටී.

ඒ බව සනාථ කිරීම සඳහා 2025.01.10 දින පත්තරෙන් එහා වැඩ සටහනෙන් විකාශය කෙරුණු වැඩ සටහන් අන්තර්ගත වීඩියෝ පට ඇතුළත් සංයුක්ත තැටිය පැ-7 ලෙස ලකුණු කර මේ සමග ඉදිරිපත් කර සිටින අතර එය පැමිණිල්ලේම කොටසක් ලෙස බාර ගන්නා මෙන් අයැද සිටී.

23. ඉහත කී 21 සහ 22 ඡේද වල සඳහන් ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය කරන ලද අදහස්, තොරතුරු අසත්‍ය අපහාසාත්මක සහ හෝ වචන ඇතුළත් වන අතර එකී ප්‍රකාශයන් මහජනතාව සහ ප්‍රේක්ෂකයන් අතර ප්‍රසිද්ධ කරනු ලැබ තිබේ.

24. ස්වාධීන රූපවාහිනී සේවය ඉතා විශාල ලෙස ශ්‍රී ලංකාවේ මහජනතාව සහ/හෝ ප්‍රේක්ෂකයන් අතර පිළිගැනීමට ලක්වන රූපවාහිනී සේවාවක් බව කියා සිටී.

25. ඉහත කී 21 සහ22 ඡේද වල සඳහන් ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය කරන මහජනතාව විසින් තේරුම්ගනු ලබන වචන, ප්‍රකාශණ,පාඨ තුළින් වක්‍රෝක්තීන් ලබා දෙන අර්ථයන් සපුරා අසත්‍ය මෙන්ම ද්වේශ සහගත ප්‍රකාශ වන අතර පැමිණිළිකරු සම්බන්ධයෙන් එම ප්‍රකාශ අපහාසාත්මක වන බව කියා සිටී. එසේම, එම ප්‍රකාශ සිදු කොට ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා ප්‍රසිද්ධ කොට ඇත්තේ ප්‍රකාශිත ද්වේශයෙන් (Express malice) බවද, පීඩක චේතනාවෙන් (Animus injuriandi) යුතු බවද, පැමිණිළිකරු ශ්‍රී ලාංකික සමාජය ඉදිරියේ වෛරයට,අපවාදයට, පිළිකුලට සහ අපහාසයට ලක් කිරීමේ වැරදි අදහසින් බවත් කියා සිටී.

26. දෙවන විත්තිකරු විසින් සිය රූපවාහිනී සේවය මගින් 1 වන විත්තිකරු විසින් සිදු කරන ලද අසත්‍ය අපහාසාත්මක ප්‍රකාශ සහ හෝ වචන ඇතුළත් ශීර්ෂ පාඨ විකාශණය කිරීමේ දී එහි අන්තර්ගතය පිළිබඳව තමන් නොදන්නවා යැයි කීමෙන් දෙවන විත්තිකරු නීතියෙන් ප්‍රතිබන්ධනයවී ඇති බව පැමිණිළිකරු ප්‍රකාශ කර සිටී.

27. පැමිණිළිකරු විසින් ඉහත කී අලාභය සම්බන්ධයෙන් රුපියල් මිලියන 100 ක් ඉල්ලා ස්වකීය නීතිඥ චතුරංග හතුරුසිංහ මගින් පළමුව එන්තර වාසියක් 2025.10.07 දිනදී ද, එකී එන්තරවාසියේ තිබූ වැඩසටහන තිබූ දිනයේ දෝෂයක් හේතුවෙන් දෙවන එන්තරවාසිය එම නීතිඥවරයා මගින්ම 2025.10.13 දිනැති එන්තරවාසිය විත්තිකරු වෙත යොමු කොට තිබූ බවත්, විත්තිකරු පැමිණිළිකරු පළවන දෝෂ සහගත එන්තරවාසියට විත්තිකරුගේ නීතිඥවරයා මගින් මගින් පිළිතුරු ලබා දී පැමිණිළිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබූ නමුත් දෙවන එන්තරාවාසියට පිළිතුරු ලබා දීම පැහැර හැර තිබූ බවයි.

එකී පළමු එන්තර වාසිය පැ8 ලෙසත් ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය පැ-8*(1)*, පැමිණිළිකරු විසින් විත්තිකරුට යොමු කරන ලද දෙවන එන්තරවාසිය පැ-8(2) ලෙසත් ලියාපදිංචි තැපැල් භාණ්ඩ

කුවිතාන්සිය පැ-8*(3)* ලෙසත්, පළමු එන්තරවාසිය සඳහා වෙන විත්තිකරුගේ නීතිඥ විසින් එවන ලද ලිපිය පැ-8(4) ලෙසත් දෙවන එන්තරවාසිය සඳහා දෙවන විත්තිකරුගේ නීතිඥ විසින් එවන ලද ලිපිය පැ-8(5) ලෙසත් ලකුණු කර මේ සමග ඉදිරිපත් කර සිටින අතර එය පැමිණිලිල්ලේම කොටසක් ලෙස පිළිගන්නා මෙන් අයැද සිටී.

එසේ හෙයින් පැමිණිළිකරුවෙත 1,2 සහ 3 වන විත්තිකරුවන්ට එරෙහිව පහත සඳහන් නඩු නිමිති උපවය වී ඇති බව කියා සිටී.

පළමුවන නිමිත්ත මත

28. ඉහත කී කරුණු හේතුවෙන් එකී රුපියල් මිලියන 100 සහ ඊට අදාළ පොලිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ශීර්ෂයේ සඳහන් පලවන විත්තිකරුට එරෙහිව නඩු පැවරීම සඳහා නඩු නිමිත්තක් උපවය වී ඇති බවයි.

දෙවන නඩු නිමිත්ත මත

29. ඉහත කී කරුණු හේතුවෙන් එකී රුපියල් මිලියන 100 සහ ඊට අදාළ පොලිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ශීර්ෂයේ සඳහන් දෙවන සහ තුන්වන විත්තිකරුවන්ට එරෙහිව නඩු පැවරීම සඳහා නඩු නිමිත්තක් උපවය වී ඇති බවයි.

30. මුද්දර ගාස්තුකාර්යය සඳහා, පැමිණිළිකරු මෙම නඩුව රුපියල් මිලියන සියයකට (රු.100,000,000/-) තක්සේරුකර සිටී.

එසේ හෙයින් පැමිණිළිකරු ගරු අධිකරණයෙන් අයැද සිටින්නේ,

අ) 1 වන විත්තිකරුගෙන් රුපියල් මිලියන 100 ක මුදල, මෙම නඩුව පවරණ දිනයේ සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා එම මුදල සඳහා වූ නෛතික පොළියද සමග සහ එකී සම්පූර්ණ මුදල ගෙවා නිම වන තෙක් තීන්දු ප්‍රකාශයේ මුලු මුදල මත නෛතික පොලියද සමග අයකර ගැනීම සඳහා විත්තිකරුට එරෙහිව නඩු තීන්දුවක් ඇතුළත් කරන ලෙසත්,

ආ) 2 වන සහ 3 වන විත්තිකරුවන්ගෙන් රුපියල් මිලියන 100 ක මුදල, මෙම නඩුව පවරණ දිනයේ සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා එම මුදල සඳහා වූ නෛතික පොළියද සමග සහ එකී සම්පූර්ණ මුදල ගෙවා නිම වන තෙක් තීන්දු ප්‍රකාශයේ මුලු මුදල මත නෛතික පොලියද සමග අයකර ගැනීම සඳහා 2 වන 3 වන විත්තිකරුවන්ට එරෙහිව එක්ව හා වෙන් වෙන්ව නඩු තීන්දුවක් ඇතුළත් කරන ලෙසත්,

ආ) නඩු ගාස්තු,

ඇ) මෙම ගරු අධිකරණයට මැනවි යැයි හැඟී යන වෙනත් සහ වැඩිමනත් සහන ලබා දෙන ලෙසත් වේ.

පැමිණිළිකරුගේ ලේඛනගත නීතිඥ